# ඓතිහාසික දඹදෙණිය විජයසුන්දරාරාමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

එම්.ඩබ්.ඒ.කේ.කේ. විතානආරච්චි

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
Makkwithanaarachchi1999@gmail.com

**මුඛ්‍ය පද** - විජයසුන්දරාරාමය, පෞරාණික, දළඳා වහන්සේ, පුරාවස්තු

## හැඳින්වීම

පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත සුප්‍රසිද්ධ ස්ථානයක් ලෙස ඓතිහාසික දඹදෙණිය විජයසුන්දරාරාමය හැඳින්විය හැක. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹදෙණිය නගරයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. තුන්වන විජයබාහු රජු විසින් මෙම පුරාණ රජමහා විහාරය ඉදිකර ඇත. ක්‍රි.ව. 1222 දී මෙම විහාරස්ථානයේ දී තුන්වන විජයබාහු රජු ග්‍රාමවාසී වනවාසී භික්ෂූන් සම්බන්ධ කරගෙන සංඝ සංශෝධනයක් කරවා මහාසාමි සංඝරක්ෂිත හිමියන්ගේ මූලිකත්වයෙන් කතිකාවතක් සම්පාදනය කළ බවත් දෙවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ (ක්‍රි.ව. 1266) දෙවන දඹදෙණි කතිකාවතත් සම්පාදනය කර ඇත. පූජාවලියෙහි දළදාව තැන්පත් කිරීමට විජයසුන්දාරාමයෙහි තෙමහල් දළඳා මන්දිරයක් ඉදි කළ බව මෙසේ සඳහන් වේ. එනම්, " එහි තුන් මහල් අලුත් දළදා ගෙය දිව්‍යමය විමානයක් සේ කරවා..." යනුවෙනි. එමෙන්ම කුරුණෑගල යුගයේ රචනා කළ දඹදෙණි අස්නෙහි විජයසුන්දරාරාමයෙහි වසර 12 ක් පුරා දළදා වහන්සේ වැඩ හිඳි බව මෙසේ සඳහන් ය. විජයසුන්දරාරාමයෙහි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත පුරාවස්තු රාශියක් හඳුනාගත හැක. ඒ අතර ශිලාමය ඉදිකිරීම් වන සඳකඩපහණ්, කොරවක්ගල්, පාදෝවන, සිරිපතුල්ගල්, පාෂාණ උළුවහු, පාෂාණ පහන්, ගල් පිටගැට, ගල්කුළුණු, පාදම්ගල, ශීර්ෂගල්, අභිලේඛන, ගල්පුවරු, පැරණි වාහල්කඩ, සිතුවම්, වීරගල්, දළදා මාලිගය පාදක කරගෙන ඉදි වූ ස්මාරක මෙන් ම පැරණි ගොඩනැඟිලි ආදිය හඳුන්වාදිය හැක. ඓතිහාසික දඹදෙණිය විජයසුන්දරාරාමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

## ක්‍රමවේදය

ඉහත පර්යේෂණ අරමුණ සඳහා පර්යේෂණ ක්‍රමවේදයන් ලෙස ක්ෂේත්‍ර ගවේෂණ සහ ක්ෂේත්‍ර නොවන ගවේෂණ ක්‍රම යොදා ගත් අතර පූර්ව පර්යේෂණ දත්ත විමර්ශනය කිරීමෙන් පසු ක්ෂේත්‍ර ගවේෂණ ලෙස දඹදෙණිය විජයසුන්දරාරාමයට ගොස් එහි පුරාවිද්‍යාත්මක දෑ අධ්‍යයනය කොට විහාරාධිපති ස්වාමීන් වහන්සේගෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරන ලදී. එමෙන් ම සාහිත්‍යය ග්‍රන්ථ හා ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනය කිරීම ආදී ක්ෂේත්‍ර නොවන ගවේෂණ මඟින් ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත සුප්‍රසිද්ධ ස්ථානයක් ලෙස සැලකිය හැකි ඓතිහාසික දඹදෙණිය විජයසුන්දරාරාමයෙහි පුරාවිද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කිරීමේ දී මෙහි පැරණි දේවාලයට පිවිසෙන දොරටුව පාමුල කැටයම් සහිත සඳකඩපහණ දැකිය හැකි අතර පැරණි දළඳා මාලිගාවට පිවිසෙන ස්ථානයේ ද කැටයම් රහිත සදකඩපහණ් දැකිය හැක. මෙහි දක්නට ලැබෙන කැටයම් සහිත සඳකඩපහණේ ලියවැලත්, හංසාවලියත්, කැටයම් කර ඇති පියුමත්, ගිනිසළු ආකාර පළාපෙතිත්, ඇතා, අශ්වයා, සිංහයා, ගවයා ආදී මෙහි නිරූපිත සත්ත්වයන් සියල්ලත් ආදිය නිරූපිතය. විජයසුන්දරාරාමයෙහි දැකිය හැකි පැරණිතම නැගෙනහිර ප්‍රාකාර බැම්මට සරල රේඛීයව මෙහි නැගෙනහිර වාහල්කඩ පිහිටා ඇත. මෙය ගල්කණු හතරක් මත පේකඩ හා තලා ද පිහිටුවා ඒ මත වහලය ඉදිකර නිමවා ඇත. වෙනත් ස්ථානයන්ගේ දැකිය නොහැකි ඇත් රූප සහිත කොරවක්ගල් ද මෙහි දැකිය හැක.

විජයසුන්දරාරාමයෙහි දක්නට ලැබෙන සමාධි බුදු පිළිම වහන්සේගේ සිවුරේ, මුහුණ, අත් හා දෙපා ඇතුළු ශරීරයේ පැහැය දිලිසෙන කහ පැහැයෙන් නිරූපණය කර ඇත. කොළ පැහැයෙන් හා කහ පැහැයෙන් දක්වා ඇති මකරුන් දෙදෙනෙකුගෙන් සමන්විත පැරණි දළදා මාලිගාවේ දැකිය හැකි මකර තොරණෙහි කිහිඹි මුහුණෙහි දළ දෙකක් පරිද්දෙන් දෙපසට විහිදී යන ලියවැල් දෙකක්, මකරුන් දෙදෙනාගේ මුව තුළට ඇතුළු වන පරිදි දක්වා ඇත. මෙම කිහිඹි මුහුණට දෙපසින් වෘෂභ, ගුරුළු, තාපස, බ්‍රහ්ම, දේව යන විවිධ ආකාරවල රූප දක්නට ලැබේ. විජයසුන්දාරාරමයේ වටදාගෙය මහනුවර යුගයේ ගෘහ නිර්මාණ ලක්ෂණ පෙන්නුම් කරන අතර මෙය මැද කුළුණක් නොමැතිව කැණිමඩලක් ආධාරයෙන් චෛත්‍යය වටේ ඇති කුළුණු පෙළක් මත වහලයේ බර දරා සිටින ලෙස ඉදිකර තිබේ. විජයසුන්දරාරාමයෙහි විහාර මළුවේ නැගෙනහිර ප්‍රාකාරයට සමීපව ඇති පුරාණ බෝධීන් වහන්සේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් හටගත් දෙතිස් ඵල බොධීන් වහන්සේගෙන් එක් නමක් බව ජනප්‍රවාදයේ සඳහන් වේ. එමෙන්ම සපු බෝධියක් ද මෙහි දැකිය හැක. ජනප්‍රවාදයේ සඳහන් අන්දමට දෙවන පැරකුම්බා රජු දන්ත ධාතූන් වහන්සේ දඹදෙණියට වැඩම වූ පසුව එසේ වැඩම වූයේ සැබෑ දළදා වහන්සේ දැයි රජුට සැකයක් ඇති වූ බවත් එම සැකය දුරු කිරීමට රජු සත්‍යයක්‍රියාවක් කර තම සිතුවිල්ල සත්‍යය නම් නිර්මිත බුදුවරුන් මැවී ප්‍රාතිහාර්යය පාන ලෙස ප්‍රාර්ථනා කළ බවත් එහි දී දන්ත ධාතූන් වහන්සේ නිර්මිත බුදුරුවක් බවට පරිවර්තනය වී සිංහල පැය හත හමාරක්, දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටි දළදා මන්දිරයේ තුන්වන මහලට නැමී තිබූ අසල පිහිටි සපු බෝධියේ අත්ත මත සිට රුවන් සක්මනක් මවා පෙරහැර පෑ බව සඳහන් වෙයි. එමෙන් ම පාෂාණ උළුවහු, පාෂාණ පහන්, ගල්පිටගැට, ගල්කුළුණු, පාදම්ගල්, ශීර්ෂගල්, ගල්පුවරු ආදිය ද මෙම විහාරස්ථානයේ දැකිය හැක.

මෙහි පුරාණ ගල් උළුවස්සක මුදුන් හරස්කඩක කොටසක් දක්නට ලැබේ. මෙය දර්ශනීය ලෙස ලීස්තර සහිතව දාර බෙදා සකස් කර ඇත. ඉපැරණි වීරගල් දෙකක් මෙම විහාරස්ථානයේ දැකිය හැකිය. මෙහි එක් පුවරුවක මිනිසෙකුට පහර දෙන ඇතෙක් ද ඊට ඉහළින් මිනිසුන් දෙදෙනෙකු ඔසවාගෙන යන ආකාරයක් ද ඉහළම තිරයේ ලිංග වන්දනාවේ යෙදෙන මිනිසුන් දෙදෙනෙකු ද නිර්මාණය කර ඇත. අනෙක් පුවරුවෙහි පහළ කැටයමේ සොල්දාදුවෙකුට පහර දෙන මිනිසුන් දෙදෙනෙකු ද පුවරුව මැද ධර්ම දේශනා කරන බුදුරජාණන් වහන්සේගේ රුවක් ද ඉහළ තිරයේ ලිංග වන්දනා කෙරෙන මිනිසුන් දෙදෙනෙකුගේ කැටයමක් ද ඇත. මෙහි ඇති පෞරාණික ස්මාරකය වන දැනට ටැම්පිට විහාරයක් බවට පත්කොට ඇති දළදා මාලිගා ගොඩනැගිල්ල හේවිසි මණ්ඩපයක් හා ප්‍රතිමා මන්දිරයක් වශයෙන් කොටස් දෙකකින් යුක්තය. හේවිසි මණ්ඩපය ගල්කුළුණු 10ක් මත දරා සිටින වහලකින් යුත් අඩි 20ක් පමණ දිගින් හා අඩි 17ක් පමණ පළලින් යුත් ඉදිකිරීමකි. මෙහි ඉහළ මහලට ඇතුළු වීම සඳහා දැවයෙන් කළ සෝපාන පන්තියක් දකුණු පැත්තෙන් ඇති අතර බීරළු වැටකින් ද ආරක්ෂිත පටු ප්‍රදක්ෂිණා පථයකින් යුක්ත ය. විජයසුන්දරාරාමයට නුදුරින් දඹදෙණියගල, වඩුවාකෙටුගල හෙවත් වඩුවාගල, කත්ගල හා බැලුම්ගල, මල්ගල වැනි පර්වත පිහිටා ඇත.

ඒ අනුව වසර 12ක් දළදා වහන්සේ වැඩසිටි ඉපැරණි ඓතිහාසික දඹදෙණිය විජයසුන්දරාරාමය ආරක්ෂා කරගත යුතු පෞරාණික විහාස්ථානයක් ලෙස හැඳින්විය හැක.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමි, ***දඹදෙණි පුරාවත***